සියලුම හිමිකම් ඇවිරිණි/ All Rights Reserved]

Eng. Nilupul Sri Sankalpa

නිලුපුල් ශ්‍රී සංකල්ප, නිලුපුල් ශ්‍රී සංකල්ප, Nilupul Sri Sankalpa, Nilupul Sri Sankalpa

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examination,Sri Lanka

ආදර්ශ ප්‍රශ්න පත්‍ර 22
Test Paper 22

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2013 අගෝස්තු
# General Certificate of Education (Adv. Level) Examination, August 2013

**සංයුක්ත ගණිතය II**
**Combined Mathematics II**

පැය: 1 විනාඩි :45
**1 hour & 45 min**

**10 S II**

ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

1. (a) මිසයිලයක් තිරස සමඟ $\alpha\left(<\frac{\pi}{2}\right)$ කෝණයක් සාදන සරල රේඛාවක ඔස්සේ $U$ ඒකාකාර ප්‍රවේගයෙන් ගමන් කරයි. පොළවේ වූ මිසයිල නාශක තුවක්තුවකට සිරස්ව $h$ උසකින් මෙය පියාසර කරන විට, $V$ ප්‍රවේගයෙන් තිරස සමඟ $\beta(>\alpha)$ කෝණයක් සාදන දිශාවට, උණ්ඩයක් නිකුත් කරයි. උණ්ඩය මිසයිලයේ ගැටෙන බව සලකා, මිසයිලයට සාපේක්ෂව උණ්ඩයේ චලිතය සඳහා ප්‍රවේග කාල ප්‍රස්ථාර තිරස් හා සිරස් චලිතය සඳහා වෙන වෙනම අඳින්න. ඒනයින් ,

   i. $\cos\beta = \frac{U\cos\alpha}{V}$ බව ද ,

   ii. ගැටුම් අවස්ථාවේ මිසයිලයට සාපේක්ෂව උණ්ඩයේ ප්‍රවේගය සොයා $V^2 > U^2\left(1+2\lambda\sin\alpha+\lambda^2\right)$ බව ද පෙන්වන්න. මෙහි, $\lambda = \frac{\sqrt{2gh}}{U}$ වේ.

(b) මුහුදු කොල්ලකරුවන්ගේ නැවක්, $P$ මුරපොළක සිට $p$ දුරකින් පිහිටි, $l$ සෘජු මාර්ගයක් ඔස්සෙ උතුරට $v$ නියත වේගයෙන් ගමන් කරයි. එක්තරා $t=0$ මොහොතක දී $P$ මුරපොළේ සිට $d$ ලම්භ දුරකින් පිහිටි, $l$ මත මුරපොළට පහලින් පිහිටි $S$ නම් ස්ථානයක සිට නැව ගමන් කරමින් තිබේ. එවිටම මුර බෝට්ටු දෙකක් නැව අල්ලා ගැනීමට, සිට දිශා දෙකක් ඔස්සේ එකම $u(<v)$ වේගයෙන් පිටත් වෙයි. ඒවා $t_1, t_2$ කාලවල දී නැව වෙත ලඟා වෙයි. $t_2 - t_1 = \frac{\sqrt{d^2u^2 - p^2v^2}}{v^2 - u^2}$ බව පෙන්වන්න.

2. (a) ස්කන්ධය $M$ වූ කුඤ්ඤයක් සුමට තලයක් මත තබා ඇත. කුඤ්ඤයේ තිරසට $\alpha\measuredangle$ ක් ආනත මුහුණත මත ස්කන්ධය $m$ වූ අංශුවක් තබා සීරුවෙන් මුදා හරිනු ලබයි. ඇතිවන චලිතයේ දී කුඤ්ඤයේ ත්වරණය $\frac{mg\sin\alpha\cos\alpha}{M+m\sin^2\alpha}$ බව පෙන්වන්න. කුඤ්ඤය $d$ දුරක් චලනය වන කාලය තුල අංශුව $s$ දුරක් ආනත තලයේ චලනය වේ නම්, $\left(1+\frac{M}{m}\right)d = s\cos\alpha$ බව පෙන්වන්න. මේසය හා කුඤ්ඤය අතර ප්‍රතික්‍රියාව $\frac{M(M+m)g}{M+m\sin^2\alpha}$ බව පෙන්වන්න.

(b) බලකොටුවකට ළගා වන මාර්ගය තිරසට $\alpha$ කෝණයක් ආනත වූ තලයකි. තලය මත $X$ ලකෂ්‍යයේ දී තුවක්කුවක් තබා ඇත. තලයට ලම්භකව $u$ ප්‍රවේගයෙන් තුවක්කුවෙන් උණ්ඩයක් නිකුත් කරනු ලැබේ. $Y$ හි දී එය තලයේ වදී.

$XY = \frac{2u^2}{g}\tan\alpha\sec\alpha$ බව පෙන්වන්න.

$Y$ හි තබා ඇති මෙවැනි තුවක්කුවකින් ඕනෑම දිශාවක් ඔස්සේ එම ප්‍රවේගයෙන්ම වෙඩි තැබිය හැක. $\alpha < \sin^{-1}\left(\frac{1}{3}\right)$ නම් $Y$ තුවක්කවේ වෙඩි වදින පරාසය තුළ $X$ පිහිටන බව පෙන්වන්න.

3. (a). උපරිම වොට් $10^3 H$ ජවයකින් යුත් එන්ජිමක් සහිත මුළු ස්කන්ධය $Mkg$ වූ දුම්රියක් නිශ්චලතාවයේ සිට තිරස් මාර්ගයක් ඔස්සේ ගෙන යනු ලැබේ. චලිතයට මුළු ප්‍රතිරෝධය නියතයක් ද එය $Rkg$ ද වේ. $10^3 H$ උපරිම ජවයෙන් කාර්යය කරන විට, එන්ජිම $Pkg$ ප්‍රකර්ෂණ බලයක් යොදයි. පසුව එනජිම නවත්වනු ලබයි නම්, දුම්රිය නියත ප්‍රතිරෝධී බලයක් යටතේ නිශ්චලතාවයට පත්වේ. ගමන්කල දුර මීටර $\dfrac{10^3 MH^2}{2PR(P-R)}$ බව පෙන්වන්න.( $g=10ms^{-2}$ ලෙස යොදා ගත හැක).

(b). කේන්ද්‍රය $O$ හා අරය $a$ සහිත, අචල සුමට ඝන ගෝලයක් තිරස් බිමක සවි කොට, ගෝලයේ පෘෂ්ඨය මත $A$ ලක්ෂ්‍යක සිට $P$ නම් බර අංශුවක් රඳවා තබා පසුව එය නිශ්චලතාවයෙන් මුදා හරිනු ලබයි. මෙහි $A$ ලක්ෂ්‍ය පිහිටා ඇත්තේ උඩු සිරස සමඟ $OA$ , $\alpha$ සුළු කෝණයක් සාදන අන්දමටය, $OP$ රේඛාව උඩු සිරස සමඟ $\theta$ කෝණයක් සාදන විට,

i. $a\overset{0}{\theta}=2g(\cos\alpha-\cos\theta)$ බවත්,

ii. අංශුව පෘෂ්ඨයෙන් ඉවත්ව යන්නේ $\cos\theta=\dfrac{2}{3}\cos\alpha$ විට බව පෙන්වන්න.

(c). $A,B,C,D,E,F$ ලක්ෂ්‍යය සවිධි ෂඩස්‍රයකය ශීර්ෂ වෙයි. $2P,P,2P,P,\lambda P,\mu P$ යන විශාලත්වයෙන් යුත් බල පිළිවලින් $AB,BC,DC,ED,EF$ හා $AF$ දිශා ඔස්සේ වෙයි.

i. පද්ධතිය සමතුලිත වන පරිදි $\lambda,\mu$ හි අගයන් සෙවිය හැකිද?. පිළිතුර පැහැදිලි කරන්න.

ii. පද්ධතිය $EB$ ඔස්සේ ක්‍රියාකාරනු ලබන බලයකට ඌණනය වනු පිණිස $\lambda,\mu$ ට තිබිය යුතු අගයන් සොයන්න.

4. $AB$ ඉණිමගක් එහි $A$ කෙළවර රළු තිරස් ගෙබිමක සහ $B$ අනෙක් කෙළවර රළු සිරස් බිත්තියක ස්පර්ශ වී නිශ්චලතාවයේ තිබෙයි. $AB$ ඉණිමග අඩංගු සිරස්තලය බිත්තියට ලම්භක වෙයි. $A,B$ එක් එක් ස්පර්ශ ලක්ෂයේ දී ඝර්ෂණ සංගුණකය $\mu$ වන අතර, ඉණිමග $G$ ගුරුත්ව කේන්ද්‍රය මහින් $AG:GB=k:1$ අනුපාතයට බෙදෙයි නම්, එහි තිරසට ආනතිය $\tan\theta=\dfrac{k-\mu^2}{\mu(k+1)}$ බව පෙන්වන්න. ඉණිමග ඒකාකාරී විට $\theta=\dfrac{\pi}{2}-2\lambda$ බව අපෝහනය කරන්න.මෙහි $\lambda$ යනු ඝර්ෂණකෝණය වේ. ඉණිමගෙහි ආනතිය $\alpha(<\dfrac{\pi}{2}-2\lambda)$ විට එය පහලට ලිස්සායාම වැළැක්වීම පිණිස ඉණිමගට යෙදිය යුතු යුග්මය $G=wa\cos(\alpha+2\lambda)$ බව පෙන්වන්න. මෙහි $W$ යනු ඉණිමගේ බර හා $2a$ යනු එහි දිග වේ.

5 (a).

$w$ $AB,AC$ $A$ හි දී සුවල ලෙස සන්ධි කර ඒවා යේ $B,C$ දෙකෙළවර

$B$ හා $C$

$\alpha(<90^0)$

(b).




රූපයේ දැක්වෙන රාමු සැකිල්ල සැහැල්ලු දඬු වලින් යුක්ත වන අතර වන අතර ජ්‍යාමිතියෙන් සමමිතික වේ.පද්ධතිය $A,C$ ආධාරක මත, තබා ඇත. $D,E$ හි දී පිළිවලින් $2W,W$ බලයන් යොදා ඇත. ප්‍රත්‍යා බල සටහනක් ඇසුරින් $BE,AB,ED$ දණ්ඩුවල ආතතිය, තෙරපුම් සොයන්න.

A A A
Nilupul Sri Sankalpa
B.Sc. Eng. (Hon's, Electrical & Electronic)
077-2249927